**නිවිතිගල ප්‍රාදේශීය සභාව - 2021**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**------------------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1. 6.1 (ඊ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉටු කරන ලද වටිනාකම රු. 320,889 ක් වූ සංවර්ධන වැඩ ගිණුම්ගත කිරීම වෙනුවට ගිවිසුම්ගත මුදල වූ රු. 403,909 ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම රු. 115,134 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම් වටිනාකම රු. 1,139,065 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම් වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු. 1,354,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | වත්කම් මිලදී ගැනීමේ වටිනාකම නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කරන ලද වාහනවල පිරිවැය රු. 2,202,800 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | වෙන්දේසි කළ වාහනවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුල සභාව සතු රු. 23,083,314 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි ඇතුලත්ව නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂයන්ට අදාලව උසාවි දඩ ආදායම් අධි වෙන්කිරීම් රු. 235,917 ක් හා 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.4.1(එ) ඡේදය මඟින් පෙන්වා දී තිබූ උසාවි දඩ අධි වෙන්කිරීම් රු. 141,720 ක් නිවැරදි නොකිරීම හේතුවෙන් උසාවි දඩ ආදායම් ගිණුම රු. 377,637 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | අධි වෙන්කිරීම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,227,262 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,323,055 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ආයතන 04 කට අදාලව රු. 45,852 ක හිඟයක් හා පෞද්ගලික ඒකක 596 කට අදාලව රු. 1,207,300 ක හිඟයක් වශයෙන් වරිපනම් ඒකක 600 කට අදාලව රු. 1,253,122 ක හිඟයක් අයකර ගතයුතුව පැවතුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ආදායම් අයකර ගත නොහැකි වූ බවත්, දේපල තහනම් කිරීමේ කටයුතු සිදුකළ නොහැකි වූ බවත් ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අයකර ගැනීමට පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොම්පෝස්ට් අංගනය සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සීමිත මිල ගණන් කැඳවීමෙන් සිදුකර තිබුණු අතර, ඒ සඳහා දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවත්, දින 12 ක් පමණක් ලබාදී තිබුණි. මිල ගණන් විවෘත කරන දින ලංසුකරුවන්ට සහභාගීවීමේ | සියළු කටයුතු එකම දිනක මුදල් ප්‍රතිපත්ති කාරක සභාව මඟින් ඉටු කරන බැවින් මිල ගණන් විවෘත කිරීම සම්බන්ධයෙන් වෙනම වාර්තාවක් සකස් නොකරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව විනිවිදභාවයකින් යුතුව මිල ගණන් කැඳවීම හා ලංසු විවෘත කිරීම සිදු කළ යුතුය. |

අවස්ථාව මගහැරී තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ අරමුණක් වන "ඇගයීමේ සහ තේරීම් කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතිකවීම" යන අරමුණ ඉටුවී නොතිබුණි. 2021 ඔක්තෝබර් 14 දිනැති ඇණවුම් අංක 609 මගින් ඇණවුම් කර එදිනම ලබාගත් භාණ්ඩ අතර, රු. 1,475,088 ක් වූ හලර් යන්ත්‍රය සහ රු. 580,000 ක් වූ දිරන කසළ කැබලි කරන යන්ත්‍රය මිලදී ගෙන ස්ථාපනය කර තිබුණද, තෙකලා විදුලිය ලබා ගන්නා තෙක් නිෂ්කාර්යයව පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල දිරන කසළ එක්රැස් කිරීම සඳහා සභාව සතු වාහන 02 ක් වෙනුවෙන් රු. 1,063,347 ක වියදමක්ද, සේවකයින් 09 දෙනෙකු ද යොදවා ඇති අතර, ඒ වෙනුවෙන් රු. 2,037,284 ක වියදමක්ද වශයෙන් වාර්ෂිකව එකතුව රු. 3,100,631 ක වියදමක් දරන නමුත් කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබූ ඉඩමෙහි කොටසක එම කසළ ගොඩගසා තිබුණු බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, විගණිත දිනය වූ 2022 මාර්තු 10 වනවිටත් විදුලි සැපයුම ලබා නොගැනීම හේතුවෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | නව ගොඩනැගිල්ලේ 2022 මාර්තු 22 දින වැඩ අවසන් කිරීම හේතුවෙන් ගොඩගසා තිබූ කසළ එම ගොඩනැගිල්ලේ රඳවා තබා ඇති බවත්, අළුතින් එකතුවන කසළ නිසි පරිදි එම ස්ථානයෙන් බැහැර කරනු ලබන බව. | කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු කඩිනමින් ආරම්භ කර කසළ ගැටළුව විසඳා ගත යුතුය. |